# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 2036/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 27/07/2024 පැය 1245

## මාධ්‍ය නිවේදනය

**01. 2024.07.26 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 71 | 100 | තඹ දඟර 01<br>ප්ලාස්ටික් බූලි 01<br>බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. හඳුනා නොගත් මත්පෙති බවට සැකකරන ඖෂධ පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර**

2024.07.26 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ කුරුණියාවත්ත මහල් නිවාස ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හඳුනා නොගත් මත්පෙති බවට සැකකරන ඖෂධ පෙති 200 සන්තකයේ තබාගත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ කුරුණියාවත්ත මහල් නිවාස සංකීර්ණයේ පදිංචිකරුවෙකු වේ.**

ඉදිරි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර.**

2024.07.26 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මතුගම පොලිස් වසමේ නවුත්තුඩුව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 610 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මතුගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වූ මතුගම බෝපිටිය ප්‍රදේශයේ පදිංචිකාරුවෙකු වේ.**

මතුගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. නිති විරෝධී ලෙස මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙලිය කඳවුර**

2024.07.26 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙලිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් නෝර්වුඩ් පොලිස් වසමේ නෝට්‍රවත්ත වැටලීමක් සිදු කර නිති විරෝධී ලෙස මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු මැණික් ගැරීමට ගන්නා උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන නෝර්වුඩ් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 40 වයස් වල පසුවන** නෝර්වුඩ් හා බගවන්තලාව යන **ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

නෝර්වුඩ් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. අනවසරෙන් රක්ෂිත ප්‍රදේශයකට ඇතුළු වී එළි-පෙහෙළි කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.07.26 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් නිලාවේලි පොලිස් වසමේ වෙන්දකාඩු රක්ෂිත භූමියට අනවසරෙන් ඇතුළු වී එළි-පෙහෙළි කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන කුච්චවේලි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු** 38 හා 45 වයස් වල **පසුවන සාම්බල්තීව් ප්‍රදේශයේ පදිංචිකාරුවන් වේ.**

කුච්චවේලි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**